(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2015 සැප්තැම්බර් මස 22 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සංවාද පිළිබඳ අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **තිලක් මාරපන මහතා,** නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** විශ්වවිද්‍යාල අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පළාත් සභා හා පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,** වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදියම් සම්බන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු (වෛද්‍ය) ඒ. ආර් .ඒ. හෆීස් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය , සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

1. **ප්‍රතිඥාදීම හෝ දිවුරුම්දීම :** (i) කළුතර මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී පොතෙහි අත්සන් කළේය.

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බිමල් නිරෝෂන් රත්නායක වීරකෝන් මහතා 99(අ) ව්‍යවස්ථාව යටතේ නීති ප්‍රකාර ප්‍රතිඥා දී පොතෙහි අත්සන් කළේය.

(iii) බදුල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් පින්තු ජයතිලක සෙනෙවිරත්න මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී පොතෙහි අත්සන් කළේය.

**2. කථානායකතුමාගේ නිවේදන** : කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සරත් මායාදුන්නේ මහතා සිය මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලැබී ඇති බවත්, එකී ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට දැන් කියවනු ලබන බවත් මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

ඊට අනුකූලව පහත සඳහන් ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී:—

"සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ
පාර්ලිමේන්තු මන්ත්‍රී
2015 සැප්තැම්බර් 04 දින.

මහ ලේකම්තුමා,
පාර්ලිමේන්තුව.

<u>මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම</u>

ගරු මහතාණෙනි,

අටවෙනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධූරයක් සඳහා ජනතා විමුක්ති පෙරමුණෙන් ජාතික ලැයිස්තුවෙන් නම් කර පත් කරන ලද මා අද දින සිට බලපාන ලෙස ඉල්ලා අස්වන බව කාරුණිකව දන්වා සිටිමි.

ගරු කථානායකතුමා ඇතුළු අදාල සියළු දෙනාටම ස්තුතිවන්ත වෙමි.

(එස්. සී. මායාදුන්නේ)
පාර්ලිමේන්තු මන්ත්‍රී"

**II**

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චාමර සම්පත් දසනායක මහතා සිය මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත ලැබී ඇති බවත්, එකී ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට දැන් කියවනු ලබන බවත් මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

ඊට අනුකූලව පහත සඳහන් ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී:—

"පාර්ලිමේන්තු මන්ත්‍රී
චාමර සම්පත් දසනායක
ඇල්ලවත්ත
නාවුල්ල
දෙමෝදර.
2015-09-14

පාර්ලිමේන්තුවේ මහ ලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටෙ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමනි

<u>පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙනි</u>

2015 අගෝස්තු මස 17 වැනි දින පැවැත්වුණු පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් බදුල්ල දිස්ත්‍රික්කයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වුණු මා මනාප ඡන්ද 64418 ක් ලබමින් දිස්ත්‍රික්කයේ දෙවෙනියා වශයෙන් තේරීපත් වුණෙමි.

8 වන පාර්ලිමේන්තුවේ සැසිවාරය 2015 සැප්තැම්බර් මස 01 වැනි දින ආරම්භ කළ අවස්ථාවේ සිට මේ දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දීම සඳහා නොපැමිණි බවත්, 2015 සැප්තැම්බර් මස 14 අද දිනය වන තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් නොදුන් අතර, කිසිවකුගේ බලපෑමක් හෝ අනු බලයකින් තොරව මාගේ සිය කැමැත්තෙන් 2015 සැප්තැම්බර් මස 14 අද දින මාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වන බව මෙම ලිපිය මගින් විශ්වාසවන්ත ලෙස ප්‍රකාශ කර සිටිමි.

ස්තුතියි,

මෙයට-විශ්වාසී,

චාමර සම්පත් දසනායක
පාර්ලිමේන්තු මන්ත්‍රී"

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) කථානායකතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XI සහ XII වැනි කොටස් සහ තුන්වැනි කාණ්ඩයේ III සහ IV වැනි කොටස් පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතු යැයිද, මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2014 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින් 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,

(i) 2015 වර්ෂය සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව;සහ

(ii) 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව-2015

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(5) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 ජුනි මස 25 දිනැති අංක 1920/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වන ලදී.

එකියන ලද නියමය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(6) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2014 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. දේශීය ආදායම් (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**5. එකතු කළ අගය මත බදු (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**6. ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**7. මුදල් :** මුදල් අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද, කැසිනෝ කර්මාන්ත අය බද්ද, සුපිරි වාසි බද්ද, ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද, නිවාස සඳහා ඍජු චන්ද්‍රිකා සේවා අය බද්ද, චන්ද්‍රිකා ස්ථාන අය බද්ද, ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද, මන්දිර බද්ද, විගමන බද්ද සහ මෝටර් වාහන ආනයනකරුවන්ගේ බලපත්‍ර ගාස්තුව පැනවීම සඳහා විධිවිධාන සැලස්වීම පිණිස ද, ඊට සම්බන්ධ හා ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**8. ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**9. විදුලි සංදේශ බදු (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**10. ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**11. පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2015 සැප්තැම්බර් මස 23 වැනි බදාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා.

1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 6.30ට කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. තේරීම් කාරක සභාව (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 121හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පවත්නා සැසි වාරයේ සේවය සඳහා වූ තේරීම් කාරක සභාව කථානායකතුමාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් වන පාර්ලිමේන්තුව විසින් නම් කරන ලද මන්ත්‍රීන් දහනව දෙනෙකුගෙන් (19) සමන්විත විය යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. තේරීම් කාරක සභාව (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාර, මෙම කාරක සභාවේ සභාපති වන ගරු කථානායකතුමාට අතිරේකව, පහත නම් සඳහන් මන්ත්‍රීන් දහනව දෙනා (19) පවත්නා සැසිවාරය තුළදී තේරීම් කාරක සභාවේ සේවය කළ යුතු ය:—

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු මනෝ ගනේසන් මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යොජනාව :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදය සහ (4) සහ (5) අනු ව්‍යවස්ථා යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා යන දෙදෙනාගේම නාම යෝජනා කිරීම මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන්නාවූ පහත සඳහන් තැනැත්තන් නම් කරනු ලැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාවේ (5) අනු ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1. ආචාර්ය අහංගමගේ ටියුඩර් ආරියරත්න මහතා
2. ශිබ්ලි අසීස් මහතා
3. ආචාර්ය රාධිකා කුමාරස්වාමි මෙනෙවිය

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. කල් තැබීම (රජයේ හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා විධිමත් ක්‍රමවේදයක් මඟින් බඳවා ගැනීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාමුඛ කරන ලදින්, විවාද විය.

(අ. භා 2.32 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

(අ. භා 2.55 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

(අ. භා 5.23 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා 6.30 වුයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව, ඊට අනුකූලව අද දින සභා සම්මුතිය අනුව, 2015 සැප්තැම්බර් මස 23 වැනි බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.